# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,911 - 2015 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා - 2015.04.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | 198 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 199 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 209 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - විසිහතරවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 82

MOD/DEF/2/01/ENL/03/ORC.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවේ පහත නම සඳහන් නිලධාරි 2012.02.26 දින සිට පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨතාවය අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවේ අධිකාරියට පත්කරනු ලැබීම සහ එම දින සිට බලපැවැත්වෙනසේ නම ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තුව වෙත ඈතුළත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

*නි/68498 ලුතිනන් ඒඩීඒ සුනිල්ජීව ශ්‍රීලංඉට පසු ආසන්නතම ජ්‍යෙෂ්ඨතාවය ඇතිව ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම.*

අ. ලුතිනන් ආරියසිංහ අසංක ප්‍රදීප් - සන්නද්ධ බුද්ධි බළකාය

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී. එම්. යූ. ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-483

2015 අංක 83

MOD/DEF/2/01/ENL/03/ORC.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම

පහත සඳහන් බලලත් නිලධාරි 2014 නොවැම්බර් මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, සන්නද්ධ බුද්ධි බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

අ. සෙ/775725 බලලත් නිලධාරි I වර්ණකුල සුරියගේ කෝසල සංජීව වර්ණකුලසූරිය

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී. එම්. යූ. ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-482

---

2015 අංක 84

DIRF/RECT/273/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

පහත සඳහන් කෙඩෙට් නිලධාරි 2014 මැයි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

සී/58184 කෙඩෙට් නිලධාරි ඉංද්‍රජිත් වික්‍රමආරච්චි

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී. එම්. යූ. ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

04-484

# රජයේ නිවේදන

## සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ රීති මාලාව

2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල (සංස්ථාගත කිරීමේ ) පනතේ 07 වගන්තියේ විධි විධාන පරිදි 2014.05.20 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ දී ඒකමතිකව අනුමත කර ගන්නා ලද සංස්ථාවේ රීති මාලාව.

1. නම : සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය

ලිපිනය : "බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, අංක 135, දහම් පාය, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.

2. සාමාජිකත්වය වර්ග දෙකකින් යුක්ත වේ.

(1) පොදු සාමාජිකයන්

(2) *නිල සාමාජිකයන්*

2.1 පොදු සාමාජිකත්වය :

(1) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලවල ගරු සභාපති ස්වාමීන් වහන්සේලා

(2) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලවල ගරු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේලා

(3) දසසිල් මාතා ජාතික සංගමයේ ගරු සභාපති මෑණියන් සහ ලේකම් මෑණියන් වහන්සේලා

(4) සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ලේකම් හෝ සභාපති

(5) ධර්ම විජය පදනමේ සභාපති හෝ ලේකම්

(6) තරුණ බෞද්ධ සංගමයේ සභාපති හෝ ලේකම්

(7) ජයග්‍රහණය ශ්‍රී ලංකා සංගමයේ සභාපති හෝ ලේකම්

2.2 නිල සාමාජිකත්වය :

(1) අනුරාධපුර භික්ෂු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායන් වහන්සේ

(2) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායන්වහන්සේ

(3) සාරිපුත්ත අධ්‍යාපන විද්‍යාපීඨයේ පීඨාධිපති ස්වාමීන්වහන්සේ

(4) අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයේ අධ්‍යක්ෂ ජනරාල් ස්වාමීන්වහන්සේ

(5) බුද්ධ ශාසන විෂයය භාර අමාත්‍යාංශ ලේකම් තුමා

(6) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා

(7) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමා

(8) සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා

(9) බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමා

(10) ශ්‍රී ලංකාවේ මහා භාරකාරතුමා

(11) පුරා විද්‍යා අධ්‍යක්ෂක ජනරාල්තුමා

(12) බෞද්ධ කටයුතු දෙපාර්තමේනේතුවේ ප්‍රධාන ගණකාධිකාරිතුමා

ඉහත නිල සාමාජිකයන් බෞද්ධයකු නොවන්නේ නම් ඊළගට සිටින ජ්‍යෙෂ්ඨතම බෞද්ධ නිලධාරියා පත්විය යුතු ය.

ඉහත සඳහන් පොදු හා නිල සාමාජිකයන් සියලු දෙනාම සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා සුදුස්සෝ වෙති.

3. *සාමාජිකත්වයෙන් ඉවත් කිරීම :*

සංස්ථාවේ අරමුණු හෝ පරමාර්ථ වලට පටහැනි අයුරින් ක්‍රියා කරන සාමාජිකයන් ඉවත් කිරීමට සංස්ථාවට බලය ඇති අතර ඒ සඳහා මහ සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් ඉවත් කිරීමේ යෝජනාව සම්මත විය යුතු ය.

4. *සාමාජිකයන් ඉල්ලා අස්වීම :*

ඕනෑම පොදු සාමාජිකයකුට සංස්ථාව වෙත කෙරෙන ලිඛිත ඉල්ලීමකින් සංස්ථාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස් විය හැක. තව ද දිසා ශාසනාරක්ෂක මණ්ඩල සභාපති හෝ ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ නමක් එසේ ඉල්ලා අස් වූ විට එම ස්වාමීන්වහන්සේගේ දිසා ශාසනාරක්ෂක මණ්ඩල තනතුර ද අහිමි වේ.

5. *විධායක කමිටුවේ ධුර දරන්නන් පත්කර ගැනීම :*

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ පරමාර්ථ හා අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත 25 දෙනෙකුගෙන් සමන්විත විධායක කමිටුවක් පත්කර ගත හැක. එම විධායක කමිටුව පත්කර ගැනීමේ දී දිසා ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවා ඇති සෑම දිස්ත්‍රික්කයකම ශාසනාරක්ෂක මණ්ඩලයකින් ගරු සභාපති ස්වාමීන්වහන්සේගේ හෝ ගරු ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේලාගේ එක් ස්වාමීන්වහන්සේ නමක් විධායක කමිටුව නියෝජනයවන සේ යෝජනා ස්ථිරත්වයෙන් පත්කර ගත යුතු ය.

(අ) ප්‍රධාන සභාපති
(ආ) නියෝජ්‍ය සභාපති 01
(ඇ) උප සභාපති 04
(ඈ) ප්‍රධාන ලේඛකාධිකාරි 01
(ඉ) නියෝජ්‍ය ලේඛකාධිකාරි 01
(ඊ) උප ලේඛකාධිකාරි 04
(උ) කෘත්‍යාධිකාරි සාමාජික මණ්ඩල සාමාජික ස්වාමීන්වහන්සේලා 10 නමක්
(ඌ) ප්‍රධාන සංවිධායක
(එ) මූල්‍ය අනුමණ්ඩල ලේකම්.

(ඒ) බුද්ධශාසන විෂයභාර අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා එම අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද නියෝජිතයෙක්

විධායක කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත් වූ එහෙත් ඉහත සඳහන් නිලයකට පත් නොවූ ස්වාමීන්වහන්සේලා අතරින් ස්වාමීන්වහන්සේලා නිකායන් නියෝජනය වන පරිදි සිව්නමක් සංස්ථාවේ අනුශාසකවරුන් වශයෙන් පත් කර ගත යුතුය.

6. *කමිටුවේ ධුර දරන්නන්ගේ බලතල, වගකීම් හා කාර්යභාරය* :

6.1 *ප්‍රධාන සභාපති ස්වාමීන්වහන්සේගේ බලතල*

(1) මහා සභා සහ කමිටු රැස්වීම්වල ප්‍රධානත්වය ගෙන ක්‍රියා කිරීම.

(2) රැස්වීම් මෙහෙයවීම හා විධායක කමිටුව හා මහ සභාව මගින් සිදු කරන සෑම කාර්යයකදීම නායකත්වය ගෙන කටයුතු කිරීම.

(3) සංස්ථාවේ චෙක්පත් අත්සන් කිරීම.

(4) ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ මගින් රැස්වීමක් කැඳවිය නොහැකි නම් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ සම්බන්ධතාවයන් ඇතිව ගරු සභාපති ස්වාමීන්වහන්සේට රැස්වීමක් කැඳවිය හැකිය.

6.2 *නියෝජ්‍ය සභාපති ස්වාමීන්වහන්සේගේ බලතල*

1. සභාපති ස්වාමීන්වහන්සේගේ කටයුතුවලට සහය වීම.

2. උන්වහන්සේ නොමැති අවස්ථාවල රැස්වීම්වල මූලිකත්වය ගෙන ක්‍රියා කිරීම.

3. ශාසනාරක්ෂක මණ්ඩල කටයුතුවල දී ගරු සභාපති ස්වාමීන්වහන්සේ හා ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේට සහය වීම.

6.3 *ගරු ප්‍රධාන ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේගේ බලතල*

1. මහා සභා හා විධායක කමිටු අනුකාරක සභා රැස්වීම් කැඳවීම.

2. මහා සභා හා විධායක කමිටු රැස්වීම් වාර්තා තබා ගැනීම, වාර්තා මහා සභාවට හා විධායක කමිටුවට ඉදිරිපත් කිරීම, වාර්තා සුරක්ෂිතව තබා ගැනීම.

3. සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පැවරෙන සියලුම කටයුතු ක්‍රියාත්මක කිරීම.

4. චෙක්පත් අත්සන් කිරීම

5. රැස්වීම්වලට පැමිණෙන සාමාජිකයින්ගේ ලේඛනයක් පවත්වා ගැනීම.

6. දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල හා බුද්ධ ශාසන අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සහ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

6.4 *ගරු නියෝජ්‍ය ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ*

1. ගරු ප්‍රධාන ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේට සහය වීම.

2. ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ රෝගාතුර වූ අවස්ථාවක ලේඛකාධිකාරී ධුරයේ කටයුතු ආවරණය කිරීම.

3. ගරු ප්‍රධාන ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේගේ උපදෙස් පරිදි උන්වහන්සේ නැති අවස්ථාවක මහා සභා රැස්වීමක හෝ විධායක සභා රැස්වීමක හෝ ගරු ප්‍රධාන ලේඛකාධිකාරී ලෙස කටයුතු කිරීම.

6.5 *ගරු උප ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ*

1. තමන් ගරු ලේඛකාධිකාරී වශයෙන් කටයුතු කරන අනුමණ්ඩල සභාවේ රැස්වීම් ගරු ප්‍රධාන ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේගේ අනුමැතිය ඇතිව කැඳවීම, වාර්තා තබා ගැනීම හා අණුමණ්ඩල ක්‍රියාත්මක කිරීම.

2. මූල්‍ය අනුකාරක සභාවේ ලේකම් අනුකාරක ගිණුම් තබා ගැනීම.

3. ලැබීම් හා ගෙවීම් පිළිබඳ කුවිතාන්සි නිකුත් කිරීම.

4. විධායක සභාවේ අනුමැතිය ලබා කරන වියදම් සඳහා කුවිතාන්සි ලබා ගැනීම.

5. සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කිරීම.

6.6 *සංවිධායක*

1. සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ කටයුතු යථා පරිදි සිදුවන අන්දමට සියලු සහාය ලබා දීම.

2. නිලවරණ රැස්වීම් කැඳවීම හා එය නිසි පරිදි පවත්වා ගෙන යෑම.

3. චෙක්පත් අත්සන් කිරීම.

4. තමන් උප සභාපති ධුරය දරන අනුකාරක සභාවේ ප්‍රධානත්වය ගෙන කටයුතු කිරීම හා ප්‍රධාන සභාපති හා නියෝජය සභාපති ස්වාමීන්වහන්සේට සහාය වීම.

6.7 *මාධ්‍ය ලේකම්*

සංස්ථාවේ කාර්යයන් පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් වෙත අවශ්‍ය තොරතුරු ලබාදීමට මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම.

7. *සභා රැස්වීම*

7.1 මහා සභා රැස්වීම් හා විධායක කමිටු රැස්වීම් යනුවෙන් දෙවර්ගයකි. මහා සභා රැස්වීම් මාස තුනකට වරක් පැවැත්විය යුතුය. විධායක සභා රැස්වීම් මාසයකට වරක් පැවැත්විය යුතු ය.

7.2 ගණ පූර්ණයේ සාමාජික සංඛ්‍යාවෙන් 1/3කි. මහ සභාවට හා විධායක සභා රැස්වීම් කැඳවීම, න්‍යාය පත්‍රය අනුව සැකසීම මහ සභා වාර්තා ඉදිරිපත් කිරීම ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ විසින් කළ යුතුය. ප්‍රධාන ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ විසින් සති 02කට කලින් රැස්වීම් සඳහා කැඳවීම කළ යුතුය.

සංස්ථාවේ දේපළ පරිහරණය කිරීම, ආරක්ෂා කිරීම හා කළමණාකරණය කිරීම ප්‍රධාන සභාපති, ප්‍රධාන ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ සහ ප්‍රධාන සංවිධායක විසින් කළ යුතුය.

8. *පුරප්පාඩු සම්පූර්ණ කිරීම :*

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ විධායක සභාවේ යම් කිසි පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක එම තනතුර හෝ තනතුරු සඳහා සුදුසු අයෙක් පත් කර ගැනීමට විධායක සභාවට බලය ඇත.

9. රීති මාලාව සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ සංශෝධනය කිරීම :

රීති මාලාව සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ සංශෝධනය කිරීම 2014 අංක දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 7 වැනි වගන්තියේ විධි විධාන පරිදි විය යුතුය.

10. දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ව්‍යවස්ථා :

දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ව්‍යවස්ථා 2014.05.20 වැනි දින පැවැත්වූ සමස්ථ ශාසනාරක්ෂක මණ්ඩල මහා සභා රැස්වීමේදී ඒකමතිකව අනුමත කරගන්නා ලද අතර පිළිවෙළින් අ සහ ආ උපලේඛනවල දැක්වේ.

මෙයට
ශාසනස්තිථිකාමී,
සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ.

ගරු ලේඛකාධිකාරි,
ගෝණදූවේ ගුණානන්ද.

ගරු සභාපති,
වැලිමිටියාවේ කුසලධම්ම නායක ස්ථවිර.

**දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ව්‍යවස්ථාව**

01. නාමය - දිවයිනේ සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් වෙනුවෙන්ම දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයක් පිහිටු විය යුතුය. එය එම දිස්ත්‍රික්කයේ නමින් විය යුතුය.

02. කාර්යාලය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලය මගින් තෝරා ගත් පොදු ස්ථානයක් මණ්ඩලයේ කාර්යාලය විය යුතුය.

03. පරමාර්ථ - ශ්‍රී ලංකාවේ බුද්ධශාසනයේ උන්නතිය, චිරස්ථිතිය හා ආරක්ෂාව උදෙසා ක්‍රියා කිරීම ශාසනාරක්ෂක මණ්ඩලයේ පරමාර්ථය වේ. ඉහත පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් අරමුණු සඵල කර ගැනීමට කටයුතු කිරීම දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ වගකීම වේ.

04. *අරමුණු :*

(i) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය.

(ii) දිස්ත්‍රික්කයේ බෞද්ධයින් පන්සිල් සුරකින චරිතවත් පිරිසක් බවට පත්කිරීමට ක්‍රියා කිරීම.

(iii) පන්සල හා ගම අතර සම්බන්ධතාව වර්ධනය කිරීම තුළින් ගිහි පැවිදි සම්බන්ධතාව තහවුරු කිරීම.

(iv) ප්‍රායෝගික ජීවිතයට අදාළවන පරිදි බෞද්ධ ජනතාවගේ දහම් දැනුම වර්ධනය කිරීම.

(v) දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම.

(vi) දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක වන බෞද්ධ සංවිධාන සම්බන්ධීකරණය තුළින් බෞද්ධයින් ඒකරාශී කිරීම.

(vii) බෞද්ධ අයිතිවාසිකම් හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම.

(viii) දිස්ත්‍රික්කය තුළ අපරාධ වැළැක්වීමට ක්‍රියා කිරීම.

(ix) ආගමික හා සමාජීය වශයෙන් වැදගත්වන වෙනත් කටයුතු සංවිධානය කිරීම.

05. *සාමාජිකත්වය :*

(i) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලවල ගරු සභාපති ස්වාමීන්වහන්සේලා.

(ii) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලවල ගරු ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේලා.

(iii) දිස්ත්‍රික් ලේකම් හා අතිරේක දිස්ත්‍රික් ලේකම්.

(iv) දිස්ත්‍රික් ලේකම් විසින් මූල්‍ය කටයුතු සඳහා නම් කරනු ලබන නිලධාරියෙක්.

(v) දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

(vi) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.

(vii) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී.

(viii) සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ.

(ix) දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරී.

(x) දිස්ත්‍රික්කයේ සියලුම බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන්.

(xi) දිස්ත්‍රික්කය තුළ ශාසනික සාමාජිය හා අධ්‍යාපනික වශයෙන් සේවාවක් සිදුකරන බෞද්ධ සංවිධානවල සභාපති හෝ ලේකම්.

06. දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීම

දිස්ත්‍රික් ලේකම් විසින් ඉහත සඳහන් සාමාජිකයින් සහභාගි කරවා ගෙන බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද දිනයක දී දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල පිහිටු විය යුතුය. විධායක සභාවට නිලධාරීන් තෝරා ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට සිදුවුවහොත් ඡන්ද හිමියන් හැටියට සැලකිය යුත්තේ භික්ෂූන් වහන්සේලා හා සිල් මාතාවන් පමණි. එහිදී බෞද්ධ කටයුතු සමායෝජක ස්වාමීන්වහන්සේලාට ඡන්ද බලය හිමි නොවන අතර තනතුරු සඳහාද ඉදිරිපත් විය නොහැක. විධායක සභිකයින් තෝරා ගැනීමේ ඡන්ද විමසීමේදී පමණක් ගිහි සාමාජිකයින්ට ඡන්ද බලය හිමි නොවේ.

07. විධායක සභාව

ශාසනාරක්ෂක මණ්ඩල විසින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විධායක සභාවක් තෝරා පත් කර යුතුය.

(අ) සභාපති (ප්‍රා.ශා.ම. ලේඛකාධිකාරි හෝ සභාපති ස්වාමීන්වහන්සේලා අතරින් තෝරා ගත යුතුය.)

(ආ) නියෝජ්‍ය සභාපති (පැවිදි)

(ඇ) ලේඛකාධිකාරි (ප්‍රා.ශා.ම. ලේඛකාධිකාරි හෝ සභාපති ස්වාමීන්වහන්සේලා අතරින් තෝරා ගත යුතුය.)

(ඈ) නියෝජ්‍ය ලේඛකාධිකාරි (ප්‍රා.ශා.ම. ලේඛකාධිකාරි හෝ සභාපති ස්වාමීන්වහන්සේලා අතරින් තෝරා ගත යුතුය.)

(ඉ) සහකාර ලේඛකාධිකාරි 05කි. මින් එක් නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයෙකු මූල්‍ය අනු මණ්ඩලයේ ලේකම් ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුදුසු නිලධාරියෙකු නම් කළ යුතුය. එම නිලධාරියා මෙම මණ්ඩලයේ භාණ්ඩාගාරික වේ.

(ඊ) නිලධාරීන් හැර විධායක සභාවට 04 දෙනෙකු පත් කර ගත යුතුය. ගිහි පැවිදි භේදයකින් තොරව පත් කර ගත හැකිය.

(උ) සංවිධායක නිල බලයෙන්ම දිස්ත්‍රික් ලේකම් විය යුතුය.

(ඌ) විධායක සභාව සෑම මසකට වරක් රැස්විය යුතුය.

08. අනුමණ්ඩල

මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කිරීම සඳහා සහකාර ලේඛකාධිකාරි ඇතුලු 05 දෙනෙකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවක් අයත් වන පරිදි අනුමණ්ඩල පත් කර ගැනීම අවශ්‍යවේ. සහකාර ලේඛකාධිකාරි අනු මණ්ඩලයේ ලේකම් වන අතර එහි ප්‍රධානියා ලෙස කටයුතු කළ යුතුය.

(අ) ආගමික අනුමණ්ඩලය.

(ආ) දහම් පාසල් අනුමණ්ඩලය.

(ඇ) සංස්කෘතික හා සමාජ සේවා අනුමණ්ඩලය.

(ඈ) ශාසනාරක්ෂක ප්‍රාදේශීය මණ්ඩල පිළිබඳ අනුමණ්ඩලය.

(ඉ) මූල්‍ය අනු මණ්ඩලය.

09. *සංවිධායක*

ව්‍යවස්ථාවේ අංක 05-1 වගන්තිය යටතේ නිල බලයෙන්ම දිස්ත්‍රික් ලේකම් සංවිධායක තනතුරට පත්වේ. එහෙත් දිස්ත්‍රික් ලේකම් බෞද්ධයෙකු නොවීමේ හේතුව මත වෙනත් සුදුසු නිලධාරියෙකු නම් කිරීමට ඔහුට බලය ඇත. සහකාර සංවිධායක අතිරේක දිස්ත්‍රික් ලේකම් වේ.

10. *මූල්‍ය ලේකම්ගේ වගකීම*

(i) මූල්‍ය අනුමණ්ඩලයේ ලේකම් වශයෙන් ඇති වගකීම දැරීම.

(ii) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ මුදල් පිළිබඳව නිසියාකාරව ගිණුම් තබා ගැනීම.

(iii) ලැබීම් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම.

(iv) විධායක සභාවේ අනුමැතිය ලබා කරන වියදම් සඳහා කුවිතාන්සි ලබා ගැනීම. මහා සභා රැස්වීම්වලට හා විධායක සභාවේ රැස්වීම්වලට ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම.

(v) ගණන් පරීක්ෂක විසින් ඉල්ලා සිටින විස්තර සැපයීම.

(vi) (අ) මණ්ඩලයේ මුදල් සුරක්ෂිතව තබා ගැනීම සඳහා මහා සභා රැස්වීමකදී සම්මත කර ගන්නා යෝජනාවක් අනුව මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සම්පත් බැංකුව හෝ ග්‍රාමීය ඉතිරි කිරීමේ බැංකුවක ගිණුමක් විවෘත කිරීම.

(ආ) විධායක සභාව අනුමත කරන්නේ නම්, ජංගම ගිණුමක් ද ඉහත කී බැංකුවක විවෘත කළ හැකිය.

(vii) බැංකු ගණුදෙනු කිරීමේදී ප්‍රධාන සංවිධායකගේ සහ ගරු සභාපති ස්වාමීන් වහන්සේගේ හෝ ගරු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේගේ හෝ මූල්‍ය ලේකම් යන තිදෙනාගෙන් එක් අයෙකුද අත්සන් තැබීම කළ යුතුය.

(viii) මූල්‍ය ලේකම් අත තබාගත හැකි උපරිම මුදල රුපියල් දහසකි (රු. 1,000)

(ix) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ සියලුම ගිණුම් පරීක්ෂාකර විධායක සභාවට හා මහා සභාවට වාර්තා කළ යුතුය.

11. *නිලකාලය*

පත්වූ නිලධාරි මණ්ඩලයේ සේවා කාලය වසර 05කට සීමාවේ.

12. *මහා සභා රැස්වීම සහ විශේෂ මහා සභා රැස්වීම්*

(අ) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් තුන්මසකට වරක් පැවැත්විය යුතුය. ලේඛකාධිකාරි විසින් සති 2කට කලින් රැස්වීම් සඳහා කැඳවීම් කළ යුතුය.

(ආ) කෘත්‍යාධිකාරි මණ්ඩලයේ වැඩි දෙනෙකු හෝ මණ්ඩලයේ සාමාජික පිරිසෙන් 1/3 කගේ (තුනෙන් එකකගේ ලිඛිත ඉල්ලීමක් ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කිරීමෙන් පසු සති 03ක් ඇතුළත දී ලේඛකාධිකාරි විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.

(ඇ) මහා සභා රැස්වීමක ගණ පූරණය සාමාජික සංඛ්‍යාවෙන් 1/5ක් හෝ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 1/4ක් නියෝජනය විය යුතුය. එම රැස්වීම්වලදී මණ්ඩලයේ වැඩ කටයුතු මෙන්ම අනු මණ්ඩල කටයුතු පිළිබඳව ද වාර්තා ඉදිරිපත් කළ යුතුය.

(ඈ) නිලධාරීන් තෝරන මහා සභා රැස්වීම හැර අනෙක් රැස්වීම් කැඳවීමේ බලය ගරු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ සතුවේ. නිලධාරීන් තේරීමේ රැස්වීම දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවිය යුතුය. මූලාසනය දැනට සිටින ගරු සභාපති ස්වාමීන්වහන්සේ විසින් ඉසිලිය යුතුය.

(ඉ) යම් වර්ෂයක් තුළ දිස්ත්‍රික් තුළ දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලය එක් වතාවක්වත් රැස්වීමක් පවත්වා නොමැති නම් එම දිස්ත්‍රික්ක ශාසනාරක්ෂක මණ්ඩලය විසුරුවා නැවත දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයක් පිහිටුවීම දිස්ත්‍රික් ලේකම් විසින් කළ යුතුය.

13. සංවත්සර මහා සභා

සෑම වර්ෂයකම සංවත්සර මහා සභාවක් පවත්වා එම අවුරුද්දේ දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේත්, ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලවලත් ප්‍රගතිය ගැන විමසා බැලිය යුතුය. සෑම අනු මණ්ඩලයකම වැඩ කටයුතු හා ප්‍රගතිය වෙන වෙනම සමාලෝචනය කළ යුතුය.

14. *විධායක සභා රැස්වීම්*

(i) දෙමසකට වරක් විධායක සභාව රැස්වීම් පැවැත්විය යුතුය.

(ii) ගණ පූරණය විධායක සභාවේ සාමාජික සංඛ්‍යාවෙන් 1/3කි.

(iii) රැස්වීමට සහභාගි වන අය සිය පැමිණීම ඊට අදාළව පවත්වාගෙන යන ලේඛනයක අත්සන තැබීමෙන් තහවුරු කළ යුතුය.

15. *ගරු සභාපති ස්වාමීන් වහන්සේගේ වගකීම*

(අ) ගරු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ මගින් රැස්වීමක් කැඳවිය නොහැකි නම්, දිස්ත්‍රික් ලේකම්ගේ සම්බන්ධතාවය ඇතිව ගරු සභාපති ස්වාමීන් වහන්සේට රැස්වීමක් කැඳවිය හැකිය.

(ආ) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දීම.

(ඇ) අවශ්‍ය විටෙක මහා සභා රැස්වීමක් හෝ අනුකාරක සභා රැස්වීමක් ගරු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ මගින් කැඳවා ගැනීම.

(ඈ) චෙක්පත් අත්සන් කිරීම.

16. *ගරු නියෝජ්‍ය සභාපති ස්වාමීන් වහන්සේගේ වගකීම*

(අ) ගරු සභාපති ස්වාමීන් වහන්සේ නොමැති අවස්ථාවලදී මහා සභා රැස්වීම්වල, විධායක සභා රැස්වීම්වල මූලාසනය ගැනීම.

(ආ) දිස්ත්‍රික් මණ්ඩල කටයුතුවලදී ගරු සභාපති හා ගරු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේලාට සහය වීම.

17. *ලේඛකාධිකාරි සතු වගකීම*

(i) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීම සඳහා වූ යෝජනා දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කිරීම.

(ii) සභාපති ස්වාමීන්වහන්සේගේ හා සංවිධායකගේ අනුමැතිය ඇතිව මහා සභා රැස්වීම්, කෘත්‍යාධිකාරි මණ්ඩල රැස්වීම් සහ සංවත්සර මහා සභා රැස්වීම් කැඳවීම වාර්තා තැබීම එම වාර්තාවල පිටපත් රැස්වීම් පවත්වා සතියක් ඇතුලත බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට එවීම.

(iii) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයට අයත් ලිපි ලේඛන හා ලිපි ද්‍රව්‍ය සුරක්ෂිතව තබා ගැනීම, අනු මණ්ඩල පිළියෙල කරන වැඩ සටහන් දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ රැස්වීම්වලට ඉදිරිපත් කිරීම.

(iv) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලවලින් ඉදිරිපත් කරනු ලබන යෝජනා දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කිරීම යනාදිය වේ.

18. *සංවිධායකගේ වගකීම*

(අ) දිස්ත්‍රික්කය තුළ ආගමික හා සාමාජික කටයුතු සඳහා දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් උනන්දු කරවීම හා නායකත්වය දීම දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල වැඩ කටයුතු කාර්යක්ෂමතාවයෙන් යුතුව කිරීමට කටයුතු සැලසීම.

(ආ) දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ සාමාජික නාම ලේඛනයක් සහ විධායක මණ්ඩලයේ නාම ලේඛනය බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත එවීමට ක්‍රියා කිරීම.

(ඇ) එසේම සිදුවන සියලු වෙනස්කම් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කළ යුතුය.

19. *දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලය අවලංගු කිරීම*

දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමේ පරමාර්ථයන්ට හා මෙම ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියා කරන සෑම දිසා මණ්ඩලයක්ම සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ

නිර්දේශ මත අවලංගු කිරීමේ බලය බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සතුවේ.

චන්ද්‍රප්‍රේම ගමගේ,
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්.

2013ක් වූ පෙබරවාරි මස 26 වැනි දින,
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව,
දහම්පාය 135,
අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

### ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ව්‍යවස්ථාව

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම මුලට ..................................ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය යනුවෙන් හැඳින්විය යුතු ය. මෙම ව්‍යවස්ථාවේ මින් පසුව ප්‍රා.ශා. මණ්ඩලය යනුවෙන් සංක්ෂිප්තව දැක්වෙනුයේ මෙම ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයයි.

02. *කාර්යාලය* :

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ ගරු ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ ගේ විහාරස්ථානය හෝ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය විසින් තෝරා ගනු ලබන ස්ථානයක් හෝ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ කාර්යාලය පවත්වා ගෙන යා යුතු ය.

03. *බල ප්‍රදේශය* :

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සියලුම ග්‍රාමනිලධාරි වසම් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ බල ප්‍රදේශයට අයත් වේ.

04. *ශාසනාරක්ෂක ප්‍රාදේශීය මණ්ඩලය ස්ථාපනය කිරීම* :

(i) රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත වරින් වර බෙදා වෙන් කරනු ලබන සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයක් පිහිට විය යුතු ය. එහෙත් කිසියම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ විහාරස්ථාන හා දහම් පාසල් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවන්හි දී එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයක් පිහිට විය යුතු ද? නැත් ද? යනු ප්‍රාදේශීය ලේකම්ගේ හා සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ නිර්දේශය අනුව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කළ යුතු ය. එමෙන්ම යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක විහාරස්ථාන හා දහම් පාසල් සංඛ්‍යාව 50 ඉක්මවන්නේ නම් සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ නිර්දේශය මත ශාසනාරක්ෂක මණ්ඩල දෙකක් පිහිටුවීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

(ii) උතුරු නැගෙනහිර දෙපළාතේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක විහාරස්ථාන හා දහම් පාසල් සංඛ්‍යාව අඩු වුවද විශේෂ අවස්ථාවක් වශයෙන් සලකා එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයක් පිහිටුවීමට ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් දීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

(iii) යම් දිස්ත්‍රික්කයක් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව වැඩි කෙරෙන හෝ අඩු කරන අවස්ථාවක දී කිසියම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ පිහිටුවා ඇති ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ නිලධාරින්ගේ තනතුරු තමාට වඩාත් හිමිකම් ඇති කොට්ඨාසයට පමණක් සීමාවේ. එලෙස හිමිකම් නොලබන නිලධාරීන් දරන තනතුරු අහිමිවන අතර ඒ සඳහා අළුතින් නිලධාරින් පත් කරගත යුතු ය. අළුතින් පත්වන නිලධාරින්ගේ නිල කාලය ශාසනාරක්ෂක මණ්ඩලයේ නියමිත නිල කාලයට සීමාවේ.

05. *පරමාර්ථය* :

(i) ශ්‍රී ලංකාවේ බුද්ධශාසනයේ උන්නතිය චිරස්ථිතියි හා ආරක්ෂාව උදෙසා ක්‍රියා කිරීම ශාසනාරක්ෂක මණ්ඩලයේ පරමාර්ථය වේ.

(ii) ඉහත පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් අරමුණු සඵල කර ගැනීමට කටයුතු කිරීම ශාසනාරක්ෂක මණ්ඩලයේ වගකීම වේ.

06. *අරමුණ* :

(i) ප්‍රදේශවාසී බෞද්ධයින් පන්සිල් සුරකින චරිතවත් පිරිසක් බවට පත්කිරීමට ක්‍රියා කිරීම.

(ii) පන්සල හා ගම අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම තුළින් ගිහි පැවිදි සම්බන්ධතාව තහවුරු කිරීම.

(iii) ප්‍රායෝගික ජීවිතයට අදාළ වන පරිදි බෞද්ධ ජනතාවගේ දහම් දැනුම වර්ධනය කිරීම.

(iv) දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම.

(v) ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන බෞද්ධ සංවිධාන සම්බන්ධීකරණය තුළින් බෞද්ධයින් ඒකරාශී කිරීම.

(vi) බෞද්ධ අයිතිවාසිකම් හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම.

(vii) ප්‍රදේශය තුළ අපරාධ වැළැක්වීමට ක්‍රියා කිරීම.

(viii) ආගමික හා සමාජීය වශයෙන් වැදගත් වන වෙනත් කටයුතු සංවිධානය කිරීම.

07. *සාමාජිකත්වය* :

නිල සාමාජිකයන් හා පොදු සාමාජිකයන් වශයෙන් සාමාජිකත්වය දෙයාකාරය.

1. *නිල සාමාජිකයෝ* :

පහත සඳහන් තනතුරු දරන රජයේ නිලධාරිහු නිල සාමාජිකත්වය ලැබීමට සුදුස්සෝ වෙති. එම නිලධාරියා බෞද්ධයෙකු නොවේ නම් ඊළඟට සිටින ජ්‍යෙෂ්ඨ බෞද්ධ නිලධාරියා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා ආයතන ප්‍රධානියා විසින් නම් කළ යුතු ය.

01. ප්‍රාදේශීය ලේකම්,
02. සහකාර ප්‍රාදේශීය ලේකම්,
03. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ,
04. රජයේ විද්‍යාලයන්හි විදුහල්පතිවරු,

05. පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
06. තරුණ සේවා නිලධාරින්,
07. පොලිස් ස්ථානාධිපති,
08. බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරින්,
09. සංස්කෘතික නිලධාරින්,
10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෞද්ධ ග්‍රාම නිලධාරින්.

2. *පොදු සාමාජිකයෝ :*

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විහාරස්ථාන, පිරිවෙන් හා දහම් පාසල්, සිල්මාතා ආරාම, ආදියෙහි පහත සඳහන් තනතුරු දරන අය පොදු සාමාජිකත්වය ලැබීමට සුදුස්සෝ වෙති.

(i) විහාරාධිපති ස්වාමීන්වහන්සේ හෝ උන්වහන්සේ විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම විහාරස්ථානයේ නිත්‍ය නේවාසික ස්වාමීන්වහන්සේ නමක්.

(ii) පරිවේණාධිපති ස්වාමීන්වහන්සේ.

(iii) දහම් පාසල් ප්‍රධානාචාර්ය ස්වාමීන්වහන්සේ/ මහතා/ මහත්මිය.

(iv) දහම් පාසල් සංවර්ධන සමිතියේ ලේකම්.

(v) විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩලයේ හෝ කාර්ය සාධක සමිතියේ හෝ දායක සභාවේ ලේකම්.

(vi) දස සිල් ආරාමාධිපති මෑණියන්.

08. *සාමාජිකත්වය ලබා ගැනීම :*

මෙම ව්‍යවස්ථාවේ 7.1 හා 7.2 ඡේදයන්හි දැක්වෙන සෑම අයෙක්ම ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ සාමාජිකත්වය ලැබීමට සුදුස්සෝ වෙති. එහෙත් ඔවුන් සියලු දෙනාම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කෙරෙන සාමාජික අයදුම් පත්‍ර පිටපත් දෙකකින් යුතුව සම්පූර්ණ කර ප්‍රදේශීය ලේකම් වෙත බාර දී සාමාජිකත්වය ලබා ගත යුතුය. එම අයදුම් පත්‍ර පිටපත් දෙකින් එක් පිටපතක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ද අනෙක් පිටපත ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ වෙතද ගොනු කර තබා ගත යුතුය. ප්‍රාදේශීය ලේකම් වෙත අයදුම් පත බාරදී දැනට සාමාජිකත්වය ලබා ඇති සාමාජිකයන් හැර සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ඇති අය අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 වෙනිදාට පෙර සාමාජිකත්වය ලබා ගත යුතුය. නිලවරණයක දී ඡන්ද බලය හිමිවනුයේ නිලවරණයට වසරකට පෙර සාමාජිකත්වය ලැබූ අයට පමණී. ප්‍රාදේශීය ලේකම් විසින් සාමාජික ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. එහි පිටපතක් බෞද්ද කටයුතු කොමසාරිස් ජනරාල් වෙතද යැවිය යුතුය. (දැනට සිටින සාමාජිකයන් අලුතින් සාමාජිකත්වයක් ලබාගැනීම අවශ්‍ය නොවේ.)

විධායක සභාව සාමාජිකයන් 15කින් සමන්විත වේ. විධායක සභාවේ ව්‍යුහය පහත සඳහන් පරිදි විය යුතුය.

| | | |
|---|---|---|
| (i) | සභාපති | 01 |
| (ii) | ගරු නියෝජ්‍ය සභාපති | 02 |
| (iii) | ගරු ප්‍රධාන ලේඛකාධිකාරී | 01 |
| (iv) | ගරු නියෝජ්‍ය ලේඛකාධිකාරී (පැවිදි) | 01 |
| (v) | ගරු උප ලේඛකාධිකාරී (පැවිදි) | 03 |
| (vi) | ගරු නියෝජ්‍ය ලේඛකාධිකාරී (ගිහි) | 01 |

(vii) ප්‍රධාන සංවිධායක.

ප්‍රාදේශීය ලේකම් නිල බලයෙන් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන සංවිධායක වේ. ඔහු හෝ ඇය බෞද්ධයෙකු නොවන්නේ නම් ඊළඟට සිටින ජ්‍යෙෂ්ඨතම බෞද්ධ නිලධාරියා ප්‍රධාන සංවිධායක වශයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් පත්කළ යුතු ය.

(viii) උප සංවිධායක (සහකාර ප්‍රාදේශීය ලේකම් උප සංවිධායක වශයෙන් නිල බලයෙන් පත්වේ) සහකාර ප්‍රාදේශීය ලේකම් කීපදෙනෙකු සිටිනම් ඔවුන් අතරින් එක් අයෙකු ප්‍රාදේශීය ලේකම් විසින් උප සංවිධායක වශයෙන් පත්කළ යුතුය. සහකාර ප්‍රාදේශීය ලේකම් බෞද්ධයෙකු නොවන්නේ නම් ඊළඟට සිටින ජ්‍යෙෂ්ඨතම බෞද්ධ නිලධාරියා උප සංවිධායක වශයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් පත්කළ යුතු ය.

(ix) නිලධාරී මණ්ඩලය හැර විධායක සභික ධුර 4ක් විය යුතුය.

10. *විධායක සභාවට නිලධාරින් තෝරා පත්කර ගැනීම :*

(i) විධායක සභාවට නිළධාරින් තේරීමේ රැස්වීමට සහභාගිවිය හැක්කේ 08 ඡේදයේ දැක්වෙන පරිදි සාමාජිකත්වය ලබාගෙන ඇති අයට පමණකි.

(ii) විධායක සභාවට තෝරා ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට සිදුවුවහොත් ඡන්දදායකයින් වශයෙන් සැලකිය යුත්තේ භික්ෂූන් වහන්සේලා හා සිල්මාතාවන් පමණී.

විහාරාධිපති, ප්‍රධානාචාර්ය, පරිවේණාධිපති තනතුරු කිහිපයක් උසුලන ස්වාමීන්වහන්සේලාට නිලවරණයේ දී හිමිවනුයේ එක් ඡන්දයක් පමණී. එක් තනතුරක් වෙනුවෙන් තමන් නිලවරණයට සහභාගිවෙමින් අනෙක් තනතුරු සඳහා නියෝජිතයන් පත්කල නොහැකිය. විධායක සභාවට නිලධාරින් තෝරාගැනීමේ දී පමණක් ගිහි සාමාජිකයන්ට ද ඡන්ද බලය හිමිවේ.

(iii) නිලධාරින් තේරීමේ රැස්වීම් පවත්වනු ලබන්නේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලබන දිනයක දී ය.

(iv) නිලධාරින් තේරීම සඳහා පැවැත්වෙන රැස්වීම ප්‍රාදේශීය ලේකම් විසින් කැඳවිය යුතු අතර එහි මූලාසනය දැනට සිටින ගරු සභාපති ස්වාමීන්වහන්සේ ඉසිලිය යුතු ය.

(v) ඡන්ද බලය හිමි සාමාජිකයන්ගේ ලේඛනය නිලවරණයට සති දෙකකට පෙර ප්‍රාදේශීය ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් හා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වෙත යැවිය යුතු ය.

(vi) විධායක සභාව සඳහා නිලධාරින් තේරීමේ දිනය බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් ඊට මාසයකට පෙර

ප්‍රාදේශීය ලේකම්ට හා දැනට සිටින ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ වෙතද දැනුම් දිය යුතුය.

(vii) සභාපති හා ලේඛකාධිකාරි තනතුරු සඳහා යෝජිත ස්වාමීන්වහන්සේලා පහත සඳහන් සුදුසුකම් වලින් සමන්විත විය යුතුය :-

(අ) සභාපති ධුරය සඳහා උපසම්පදාවෙන් වසර 20ක් සම්පූර්ණ වූ දැන උගත් විහාරාධිපති ස්වාමීන්වහන්සේ නමක් විය යුතුය.

ලේඛකාධිකාරි ධුරය සඳහා-

(ආ) උපසම්පදාව ලබා වසර 10ක් සම්පූර්ණ වී තිබීම ;

(ආ) විශ්ව විද්‍යාල උපාධිධාරියෙකු වීම හෝ ප්‍රාචීන පණ්ඩිත උපාධිධාරියෙකු වීම හෝ අවම වශයෙන් ප්‍රාචීන මධ්‍යම විභාගය හෝ විශ්වවිද්‍යාලය ප්‍රථම වර්ෂ පරීක්ෂණය සමත්වීම හෝ වසර 5කට නොඅඩු කාලයක් ශාසනාරක්ෂක මණ්ඩලයට සභාපති හෝ ලේඛකාධිකාරී ධුරයක් දැරීම හා විහාරාධිපති ප්‍රධානාචාර්ය, පරිවෙණාධිපති ස්වාමීන් වහන්සේ නමක් වීම ;

(ඇ) ඉහත සඳහනක් ස්වාමීන්වහන්සේලා නොමැති අවස්ථාවක උපරිම සුදුසුකම් ඇති ස්වාමීන් වහන්සේලාගේ නම් යෝජනා කළ හැකිය ;

(ඈ) පාර්ලිමේන්තු, පළාත් සභා හෝ ප්‍රාදේශීය සභාවන්හි මන්ත්‍රී ධුර දරන ස්වාමීන්වහන්සේලාගේ නම් ශාසනාරක්ෂක මණ්ඩලයේ නිලතල සඳහා යෝජනා කළ නොහැකිය ;

(ඉ) එක් ස්වාමීන් වහන්සේ නමකගේ නම තනතුරු කීපයක් සඳහා යෝජනා කළ නොහැකිය.

(viii) එක් ශාසනාරක්ෂක මණ්ඩලයක නිලයක් දරන ස්වාමීන්වහන්සේ නමකගේ නමක් තවත් ශාසනාරක්ෂක මණ්ඩලයක නිලතල සඳහා යෝජනා කළ නොහැකිය.

(ix) නිලධාරීන් තේරීමේ රැස්වීමෙන් අනතුරුව ඇතිවන පුරප්පාඩු සඳහා සුදුස්සන් පත්කර ගැනීමේ බලය විධායක සභාව සතු වේ. එහෙත් එම පත්කර ගැනීම් පිළිබඳව ඊළඟ පැවැත්වෙන මහා සභාව වෙත වාර්තා කළ යුතු ය.

(x) නිලධාරීන් තේරීම පිළිබඳව පැමිණිලි ඇතොත් නිළ වරණය පවත්වා සති තුනක් ඇතුළත බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. ඒ පිළිබඳව දිස්ත්‍රික් ලේකම් මගින් පරීක්ෂණයක් පවත්වා එම පරීක්ෂණ වාර්තාව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ නිර්දේශ මත පැමිණිලි ලැබී ඇති නිලධාරීන්ගේ නිලතල බල රහිත කිරීමට හෝ නිලවරණය අවලංගු කිරීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

11. *ශාසනාරක්ෂක මණ්ඩලයේ නිල කාලය*

නිලවරණයකින් තෝරාගනු ලබන ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ නිලධාරීන්ගේ නිලකාලය අවුරුදු 5කි. එහෙත් විශේෂ හේතුවක් නිසා සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත නිලකාලය දීර්ඝ කිරීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

12. *අනුකාරක සභා :*

ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ පරමාර්ථය හා අරමුණු සඵල කර ගැනීම සඳහා පහත සඳහන් අනුකාරක සභා පත්කර ගත යුතුය :-

01. දහම් පාසල් අනුකාරක සභාව ;
02. ආගමික සංස්කෘතික අනුකාරක සභාව ;
03. සමාජ සේවා හා බෞද්ධ සමිති අනුකාරක සභාව ;
04. මූල්‍ය අනුකාරක සභාව.

අනුකාරක සභාවක සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව 05 දෙනෙක් වේ. ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ව්‍යවස්ථාවේ 08 - VI හා V වගන්තිවලට අනුව විධායක සභා නිලධාරීන් තේරීමේදී පත්කර ගන්නා ලද ගරු නියෝජ්‍ය ලේඛකාධිකාරිවරු එක් එක් අනුකාරක සභාවේ ලේකම් වශයෙන් පත්කර ගත යුතුය. අනුකාරක සභා සඳහා අනෙක් සාමාජිකයන් නිලවරණ රැස්වීමේදී පත්කර ගත යුතුය. එම සාමාජිකයන් අතරින් එක් අයෙකු අනුකාරක සභාවේ සභාපති වශයෙන් පත්කර ගත යුතුය.

01. *දහම් පාසල් අනුකාරක සභාව*

(i) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයට අයත් දහම් පාසල් නැති සෑම විහාරස්ථානයකම දහම් පාසල් ආරම්භ කිරීමට හා විධිමත් අයුරින් පවත්වා ගැනීමට අනුග්‍රහ දැක්වීම.

(ii) දහම් පාසල් පෙළ පොත් නාම ලේඛන හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් දහම් පාසල් සඳහා ලබාදෙන වෙනත් ආධාර බෙදා දීමේදී ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේලාට සහාය වීම.

(iii) දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් ශ්‍රේණි විභාග ත්‍යාග ප්‍රදානෝත්සව ගුරු පුහුණු ශිෂ්‍ය නායක වැඩමුළු ආදී කටයුතුවලදී ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේට සහාය වීම.

(iv) දහම් පාසල් සම්බන්ධ කරගෙන ගිලානෝපස්ථාන, ශ්‍රමදාන, පරිසර සංරක්ෂණ ආදී ප්‍රායෝගික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

02. *ආගමික හා සංස්කෘතික අනුකාරක සභාව*

(i) ප්‍රදේශය තුළ සීල, භාවනා, පින්කම්, ධර්ම සාකච්ඡා, විශේෂ දේශන පැවැත්වීම ආදී බෞද්ධ ප්‍රබෝධයට තුඩුදෙන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(ii) ආගමික හා සංස්කෘතික වටිනාකම් වලින් සමන්විත පෙරහැර පැවැත්වීම.

(iii) සිංහල අළුත් අවුරුද් චාරිත්‍ර අනුගමනය කිරීමට උනන්දු කරවන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(iv) ගිහි පැවිදි ජාතික වීරයන් හා රණවිරු අනුස්මරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(v) සදාචාර වර්ධනයට ඉවහල් වන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

03. *සමාජ සේවා හා බෞද්ධ සමිති අනුකාරක සභාව*

(i) විහාරස්ථාන කාර්ය සාධක ආදි බෞද්ධ සංවිධානයන්හි කටයුතු අධීක්ෂණය.

(ii) විහාරස්ථාන කාර්ය සාධක සමිති නැති විහාරස්ථානයන්හි කාර්ය සාධක සමිති ආරම්භ කිරීමට අනුග්‍රහ දැක්වීම

(iii) බෞද්ධ සමිති ඒකාබද්ධ කර ගෙන මත්ද්‍රව්‍ය නිවාරන හා අපරාධ මර්ධනයට ඉවහල්වන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(iv) අක්‍රිය බෞද්ධ සමිති ක්‍රියාත්මක කිරීමට උනන්දු කරවීම.

04. *මූල්‍ය අනුකාරක සභාව :*

(i) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය සඳහා අරමුදලක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා ගරු ලේඛකාධිකාරි ස්වාමින්වහන්සේට සහාය වීම.

(ii) එම අරමුදල වර්ධනය කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම.

(iii) අරමුදලේ මුදල් පිළිබඳ විස්තර (අයවැය වාර්තා) වාර්ෂිකව මහා සභාව වෙත ඉදිරිපත් කිරිම.

13. *විධායක සභාවේ රැස්වීම :*

(i) මසකට වරක් විධායක සභාවේ රැස්වීම පැවැත්විය යුතු ය.

(ii) ගණ පූරණය විධායක සභාවේ සාමාජික සංඛ්‍යාවෙන් 1/3 කි.

(iii) රැස්වීමට සහභාගි වන අය සිය පැමිණීම ඊට අදාළව පවත්වාගෙන යන ලේඛනයක අත්සන් තැබීමෙන් කහවුරු කළ යුතු ය.

14. *ගණන් පරීක්ෂක :*

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරයා නිල බලයෙන් පත්වේ. විධායක සභාවේ රැස්වීම්වලට ඔහු කැඳවිය යුත්තේ අත්‍යවශ්‍ය නම් පමණි. තීරණ ගැනීමේ දී ඡන්දය පාවිච්චි කිරීමේ බලය ඔහුට හිමි නොවේ. තීරණ ගැනීමේ දී හැමවිටම වැඩිදෙනාගේ කැමැත්තෙන් තීරණවලට එළඹිය යුතුවේ.

15. *මහා සභා රැස්වීම :*

(i) යටත් පිරිසෙයින් සිවුමසකට වරක්වත් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු ය. අවශ්‍යතාවය මත ඕනෑම මහ සභා රැස්වීම් ගණනනක් වසරක් තුළ පැවැත්විය හැකි ය. ගරු ලේඛකාධිකාරි ස්වාමින්වහන්සේ විසින් සභාපති ස්වාමින්වහන්සේගේ ද එකඟතාවය ඇතිව රැස්වීම් කැඳවිය යුතු ය. (නිලධාරීන් තෝරන මහා සභා රැස්වීම් කැඳවීමේ බලය ගරු ලේඛකාධිකාරි ස්වාමින්වහන්සේ සතුවේ.)

(ii) (අ) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ලඩයේ සාමාජික පිරිසකගේ 1/3 ලිඛිත ඉල්ලීමක් ලැබුණුවිට විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකිය.

(ආ) බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් මත සභාපති ස්වාමින්වහන්සේට හා ප්‍රාදේශීය ලේකම්ට විශේෂ මහා සභාවක් කැඳවීමේ අයිතිය ඇත.

(ඇ) මහා සභාවක් සඳහා අවශ්‍ය ගණපූර්ණය සාමාජික සංඛ්‍යාවෙන් 1/5 ක් විය යුතු ය.

(ඈ) විශේෂ මහා සභාවක් සඳහා ගණපූර්ණය සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් විය යුතු ය.

(ඉ) නිලධාරින් තෝරා ගැනීමේ රැස්වීම් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කැඳවිය යුතු ය.

(ඊ) පිට පිට රැස්වීම් වාර 3කට සහභාගි නොවීම සාමාජිකත්වය අහිමිවීමට හේතුවේ.

(උ) සාමාජිකත්වය අහිමිවූ සාමාජිකයන් පිට පිට 3න් වතාවක් නැවත රැස්වීම්වලට සහභාකි වීමෙන් යළිත් සාමාජිකත්වය හිමිවේ.

16. *අනුකාරක සභා රැස්වීම් :*

(i) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ගරු සභාපති/ගරු ලේඛකාධිකාරි ස්වාමින්වහන්සේට කවර හෝ අනුකාරක සභා රැස්වීමකට සහභාගි විය හැක.

(ii) නිලධාරි තෝරා ගත් රැස්වීමෙන් පසුව ඒ ඒ අනුකාරක සභා රැස්වී ඉදිරි වර්ෂය සඳහා සුදුසු වැඩ පිළිවෙළක් කෙටුම්පත්කොට විධායක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

(iii) අනුකාරක සභාවේ සාමාජික සංඛ්‍යාව 05ක් දෙනෙක් වන අතර ගණපූර්ණය සාමාජිකයින් තුන් දෙනෙකි.

17. *නිලතල අහෝසිවීම :*

සිය තනතුරෙන් ඉල්ලා අස්වීම, ප්‍රදේශය හැර යාම, සේවය කළ නොහැකි තත්වයේ රෝගියෙකු බවට පත්වීම, නොදන්වා පිට පිට රැස්වීම් වාර තුනකට සහභාගි නොවීම, මිය යාම සහ නම් කිරීමකින් සාමාජිකත්වය ලබන අයගේ නම, නම් කරන තැනැත්තා විසින් ඉල්ලා අස්කර ගැනීම යන අවස්ථාවල දී තනතුර අහෝසි වේ. විධායක සභාව විසින් එම පුරප්පාඩුව පිරවිය යුතු ය.

18. *විධායක සභාවේ වගකීම් :*

(i) ගරු සභාපති ස්වාමින්වහන්සේ :

(අ) ගරු ලේඛකාධිකාරි ස්වාමින්වහන්සේ මගින් රැස්වීමක් කැඳවිය නොහැකි නම් ප්‍රාදේශීය ලේකම්ගේ සම්බන්ධතාවය ඇතිව ගරු සභාපති ස්වාමින්වහන්සේට රැස්වීමක් කැඳවිය හැකිය.

(ආ) ශාසනාරක්ෂක මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දීම.

(ඇ) අවශ්‍ය විටක මහා සභා රැස්වීමක් හෝ අනුකාරක සභා රැස්වීමක් ගරු ලේඛකාධිකාරි ස්වාමින්වහන්සේ මගින් කැඳවා ගැනීම.

(ඈ) චෙක්පත් අත්සන් කිරීම.

(ii) ගරු නියොජ්‍ය සභාපති ස්වාමීන්වහන්සේ

(අ) ගරු සභාපති ස්වාමීන්වහන්සේ නොමැති අවස්ථාවල දී මහ සභා රැස්වීම්වල විධායක සභා රැස්වීම්වල මූලාසනය ගැනීම.

(ආ) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල කටයුතුවලදී ගරු සභාපති හා ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ වහන්සේලාට සහාය වීම.

19. ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ

(i) රැස්වීම් කැඳවීම.

(ii) වාර්තා තබාගැනීම.

(iii) අනුකාරක සභාවල වර්තා ලබාගැනීම අධීක්ෂණය හා ඒවා ක්‍රියාත්මක කිරීම.

(iv) රැස්වීම්වලට පැමිණෙන සාමාජිකයන්ගේ ලේඛනයක් පවත්වා ගැනීම.

(v) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පැවරෙන සියලුම කටයුතු ක්‍රියාත්මක කිරීම.

(vi) චෙක්පත් අත්සන් කිරීම.

(vii) දිස්ත්‍රික් ලේකම්, දිසා ශාසනාරක්ෂක මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සමග සියලුම කටයුතු සම්බන්ධීකරණය.

20. *ගරු නියෝජ්‍ය ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ*

(i) ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේ විදේශගත වූ අවස්ථාවක ලේඛකාධිකාරී ධුරයේ කටයුතු ආවරණය කිරීම.

(ii) ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේට සහාය වීම.

(iii) ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේගේ උපදෙස් පරිදි උන්වහන්සේ නැති අවස්ථාවක මහ සභා රැස්වීමක හෝ කාරක සභා රැස්වීමක හෝ ලේඛකාධිකාරී ලෙස කටයුතු කිරීම.

21. *උප ලේඛකාධිකාරී*

(i) තමන් ගරු ලේඛකාධිකාරී වශයෙන් කටයුතු කරන අනුකාරක සභාවේ රැස්වීම් කැඳවීම, වාර්තා තබා ගැනීම හා අනුකාරක සභාව ක්‍රියාත්මක කිරීම.

(ii) අනුකාරක සභාවේ වාර්තා කාරක සභාවට ඉදිරිපත් කිරීම.

22. *මූල්‍ය ලේකම්*

(i) මූල්‍ය අනුකාරක සභාවේ ලේකම් වශයෙන් ඇති වගකීම දැරීම.

(ii) අනුකාරක සභාවේ මුදල් පිළිබඳව නිසියාකාරව ගිණුම් තබා ගැනීම.

(iii) ලැබීම් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම හා වැය කිරීම් සඳහා කුවිතාන්සි ලබාගැනීම.

(iv) විධායක සභාවේ අනුමැතිය ලබා කරන වියදම් සඳහා කුවිතාන්සි ලබා ගැනීම, මහ සභා රැස්වීම්වලට හා විධායක සභාවේ රැස්වීම්වලට ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම.

(v) ගණන් පරීක්ෂක විසින් ඉල්ලා සිටින විස්තර සැපයීම.

(vi) (අ) මණ්ඩලයේ මුදල් සුරක්ෂිතව තබා ගැනීම සඳහා මහ සභා රැස්වීමක දී සම්මත කර ගන්නා යෝජනාවක් අනුව මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සම්පත් බැංකුව හෝ ග්‍රාමීය ඉතිරි කිරීමේ බැංකුවක ගිණුමක් විවෘත කිරීම.

(ආ) විධායක සභාව අනුමත කරන්නේ නම් ජංගම ගිණුමක් ද ඉහත කී බැංකුවක විවෘත කළ හැකිය.

(vii) බැංකු ගනුදෙනු කිරීමේ දී ප්‍රධාන සංවිධායකගේ සහ ගරු සභාපති ස්වාමීන්වහන්සේගේ හෝ ගරු ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේගේ හෝ මූල්‍ය ලේකම් යන තිදෙනාගෙන් එක් අයෙකු ද අත්සන් තැබීම කළ යුතු ය.

(viii) මූල්‍ය ලේකම් අත තබාගත හැකි උපරිම මුදල රුපියල් දහසකි. (1,000/-)

(ix) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ සියලුම ගිණුම් පරීක්ෂා කර විධායක සභාවට හා මහ සභාවට වාර්තා කළ යුතු ය.

23. *සංවිධායක*

(i) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ කටයුතු යථා පරිදි සිදුවන අන්දමට සියලු සහාය දීම.

(ii) ශාසනාරක්ෂක මණ්ඩලය අක්‍රියව අවිධිමත්ව, ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියාකරන අවස්ථාවල දී ශාසනාරක්ෂක මණ්ඩලය පිළිබඳව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

(iii) ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ඇතිවන වෙනස්කම් දිසා ශාසනාරක්ෂක මණ්ඩලය වෙත හා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දීම.

(iv) වසර 05කට පසුව නිලධාරීන් තෝරා ගැනීම සඳහා පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සාමාජික ලැයිස්තුව ප්‍රදර්ශනය කර බෞද්ධ කොමසාරිස් ජනරාල් නියම කරන දිනට ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයට නව නිලධාරීන් තෝරා පත්කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු යෙදීම.

(v) නිලධාරීන් තෝරන රැස්වීමට පෙර ශාසනාරක්ෂක ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයට අයත් සියලු ලිපි ලේඛන අදාළ නිලධාරීන් වෙතින් තමා වෙත භාර ගෙන භාරදුන් බවට ලිපියක් නිකුත් කිරීම හා නව නිලධාරීන් පත් වූ පසු එම නව නිලධාරීන් හට ඒවා බාරදීම.

(vi) නිලධාරීන් තෝරන මහ සභා රැස්වීම කැඳවීම හා එය නිසි පරිදි පවත්වාගෙන යාම.

(vii) චෙක්පත් අත්සන් කිරීම.

10. *උප සංවිධායක*

(i) ගරු ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ හා සංවිධායකගේ වැඩ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට සහාය දීම.

(ii) ගරු ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේ විසින් එවනු ලබන වාර්තා සුරක්ෂිතව තබා ගැනීම හා ඒවායේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම.

24. *අතුරු ව්‍යවස්ථා පැනවීම.*

මේ ව්‍යවස්ථාව යටතේ ක්‍රියා කිරීමේදී ඒ ඒ ප්‍රදේශවල ප්‍රායෝගික වශයෙන් ඇතිවන කිසියම් අවශ්‍යතාවක් වෙතොත් ඊට අවශ්‍ය අමතර අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම දිසා ශාසනාරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කළ හැකිවේ. එවැනි අවස්ථා ගැන බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වාර්තා කළ යුතු වේ.

25. *ව්‍යවස්ථා අර්ථ නිරූපණය*

ව්‍යවස්ථා මාලාවේ යම් කරුණක් සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් හෝ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙලක් හෝ සැක සහිත අවස්ථාවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ තීරණය ලබාගත යුතුවේ. එම තීරණයට සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබිය යුතුවේ.

26. *දිසා ශාසනාරක්ෂක මණ්ඩල මගින් කෙරෙන අධීක්ෂණ*

ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලවල පැන නගින එයට විසඳා ගත නොහැකි කරුණු සම්බන්ධව දිසා ශාසනාරක්ෂක මණ්ඩල විසින් විමර්ශනය කර සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය දෙන තීරණය අවසන් තීරණය වේ.

27. ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල අවලංගු කිරීම හෝ නිලධාරින්ගේ සේවාව අහෝසි කිරීම යම් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයක කටයුතු අසතුටුදායක නිසා එය අවලංගු කිරීමට සිදුවුවහොත් හෝ යම් යම් නිලධාරින්ගේ සේවාව අහෝසි කිරීමට සිදුවුවහොත් ඒ අනුව පත්වන මණ්ඩලයේ හෝ නිලධාරින්ගේ නිල කාලය මුලදි පැවති මණ්ඩලයේ ඉතිරිව ඇති නිල කාලයට සීමාවේ. යම් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයක් මෙහි සඳහන් පරමාර්ථයන් හා ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන්නේ නම් හෝ අකාර්යක්ෂමව පවතින්නේ නම් හෝ එවැනි ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයක් විසුරුවා හැරීමට සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ නිර්දේශය පරිදි බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

28. ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල අහෝසි වූ අවස්ථාවක අලුතින් මණ්ඩලයක් පත්කර ගන්නා තුරු ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය සතු බලතල ප්‍රාදේශීය ලේකම් වෙතට පැවරේ.

29. මෙම ව්‍යවස්ථාවෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධව අවසාන තීරණයක් ගැනීමේ බලතල බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සතුවේ. 2013.01.01 සිට මෙම ව්‍යවස්ථාව බලාත්මක වේ.

චන්ද්‍රප්‍රේම ගමගේ,
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්.

2013 පෙබරවාරි මස 26 වැනි දින,
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව,
දහම්පාය 135,
අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07,

04 - 701

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව " වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් මස 19 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, වෙන්නප්පුව, අලුත් පාරේ, අංක 22 දරන ස්ථානයේ පදිංචි, එකී ජනරජයේ, ලුනුවිල, ඉන්ඩස්ට්‍රියල්, එස්ටේට් හි අංක 08 දරන ස්ථානයේ ලියාපදිංචි අංක 25/1128 යටතේ එන්. එම්. එන්ටර්ප්‍රයිසස් යන නාමයෙන් වූ තනි හිමිකාර ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන මෙහි මින්මතු "බන්ධනදායී " වශයෙන් හඳුන්වනු ලබන, ජාතික හැඳුනුම්පත් අංක 680980802V හිමි, හේවාතන්ත්‍රිගේ ටෙරන්ස් අජිත් පීරිස් යන අය විසින් මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු ඇමෙරිකානු ඩොලර් එක්ලක්ෂ අනූපන්දහසක (ඇ. ඩො. 195,000) මුදල සහ ඒ මත පොළිය ගෙවීම සඳහා එකී බන්ධනදායී විසින් වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ශ්‍රීනා නිලුක්ෂි තිසේරා විසින් ඇමෙරිකානු ඩොලර් එක්ලක්ෂ හැටඅටදහස් එක සියයක (ඇ. ඩො. 1,68,100) මුදල සඳහා සහතික කරන ලද අංක 1582 සහ 2014 පෙබරවාරි මස 28 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කිරීමෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ ඇපයක් වශයෙන් යූනියන් බැංකුව වෙත උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද ඒ අනුව ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2014 ඔක්තෝබර් මස 20 වැනි දිනට මුළු හිඟ මුදල වන ඇමෙරිකානු ඩොල්ර් එක්ලක්ෂ අනූනව දහස් විසිහතරකුත් ශත තිස් දෙකක (ඇ. ඩො. 1,99,024,32) මුදල සහ 2014 ඔක්තෝබර් මස 21 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත පොළිය ද එකී බන්ධනදායීන්ගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය හෝ එයින් කොටසක් එකී බන්ධනදායී විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදු කර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2014 ඔක්තෝබර් මස 20 වැනි දිනට මුළු හිඟ මුදල වන

ඇමෙරිකානු ඩොලර් එක්ලක්ෂ අනූනව දහස් විසිහතරකුත් ශත තිස් දෙකක (ඇ. ඩො. 1,99,024,32) මුදල සහ 2014 ඔක්තෝබර් මස 21 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත පොළිය ද, තවද, ඉහත කී අංක 1582 දරන බැඳුම්කරය සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ශ්‍රීනා නිලුක්ෂි තිසේරා විසින් සහතික කරන ලද ඉහත කී අංක 1582 සහ 2014 පෙබරවාරි මස 28 දින දරන එකී උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛණයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ ඉහත කී 1990 අංක 04 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

*1 වන ඉඩම*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද වෙන්නප්පුව ග්‍රාමසේවා නිලධාරී වසමේ, වෙන්නප්පුව ගමේ පිහිටි, මාඳන්ගහවත්ත සහ කජුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 597 සහ 1994 ජුනි මස 11 දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 03 දරන බිම් කොටසට මායිම්, උතුරට : පාර (වෙන්නප්පුව සිට කිරිමැටියාන) ද, නැගෙනහිරට : අංක 597 දරන මානක පිඹුරේ නිරූපිත කැබලි අංක 05 (අඩි 12ක් පළල පාර) ද, දකුණට : අංක 597 දරන මානක පිඹුරේ නිරූපිත කැබලි අංක 04 ද, බස්නාහිරට : අංක 597 දරන මානක පිඹුරේ නිරූපිත කැබලි අංක 02 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 597 දරන මානක පිඹුරට අනුව පර්චස් තිස්තුනයි දශම හතයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 33.70) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම ඉඩම් කැබැල්ල මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G167/212 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කැබැල්ල මෑත කාලයේ කළ මැනීමට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

